# 2025 ජුනි මස මාසික සභා රැස්වීම් වාර්තාව

## තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

ස්ථානය - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව
දිනය - 2025.06.13
වේලාව - පෙ.ව. 10.00

පැමිණීම

| | නම | | තනතුර |
|---|---|---|---|
| I. | එච්.එල්.ජයසිරි | - | ගරු සභාපති |
| II. | ආර්.රජිත් ප්‍රියදර්ශන | - | ගරු උපසභාපති |
| III. | හර්ෂ උදයකුමාර ජයවීර | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| IV. | ආර්.කේ.එම්.රෝහිත | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| V. | එම්.එල්.එම්.හනීෆා | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| VI. | කේ.රත්න | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| VII. | එම්.ඒ.ආරියසේන | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| VIII. | එන්.ටී.චමින්ද ජයනාත් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| IX. | පී.එම්.අනුර ප්‍රියන්ත | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| X. | එම්.එල්.එම්.අසාර් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XI. | බී.කේ.නිලුකා කුමුදුනි | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XII. | ආර්.ඩබ්ලිව්.සිරිසේන | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XIII. | කේ.පී.තමිලා දිල්රුක්ෂි | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XIV. | සුදත් චමින්ද උයනහේවා | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XV. | බී.නිපුන ගයාශාන් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XVI. | එස්.දයාසේන | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XVII. | එල්.වයි.නුවන් චතුරංග | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XVIII. | ජේ.ඒ.තනුජා දිලානි | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XIX. | උදානි ලියනගේ | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XX. | එල්.ඒ.සුනිල් පියංකර | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XXI. | ඩබ්ලිව්.පී.සුජීවා නිල්මිණි | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XXII. | එච්.එල්.වීරේන්ද්‍ර විරාජ් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

නොපැමිණීම :- ---

ප්‍රථමයෙන්ම සියලුම දෙනා ආගම සිහිකිරීමෙන් අනතුරුව,ගරු සභාපති , එච්.එල්.ජයසිරි මහතා විසින් 2025 වර්ෂයේ මංගල මහ සභාව පැවැත්වෙන අද දින පැමිණ සිටින ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්,ලේකම්තුමිය හා මාධ්‍යවේදී ඒ.ඒ.ප්‍රේමසිරි මහතාත් , රුක්මන් රත්නායක මහතා ඇතුළු පිරිස පිළිගන්නා ලදී.

මංගල මහ සභාවේ ආරම්භක අවස්ථාව අමතනු ලැබූ ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා ප්‍රාදේශීය සභාව යනු ජනතාවට සේවා පහසුකම් සපයන ආයතනයක් වන බවත්,ඒ සඳහා මහජන නියෝජිතයන් වන අප සියලු දෙනා සහෝදරත්වයෙන් සාමූහිකව ඒකරාශී වී ජනතාවට සේවා සැපයීම අපේක්ෂා කරගනිමින් කටයුතු කළ යුතු බවත් ඒ සඳහා හොඳ අවබෝධයකින් යුතු තරුණ මහජන නියෝජිතයින් පිරිසක් මෙහි සිටින බවත් ප්‍රකාශ කරන ලදී.2002-2010 යන කාලපරිච්ඡේදය තුළ පැවැති අපගේ පාලන සමයේ දී ,අනෙකුත් දේශපාලන පක්ෂ නියෝජිතයන් වන හිටපු සභාපතිවරුන් වන එන්.ටී.දයානන්ද මහතා, බුද්ධදාස ජයසූරිය මහතා සහ ජයන්ත සේනානායක මහතා ,වාසි ගුණරත්න මහතා හා චාලි ගුණරත්න මහතා යන පරිනත දේශපාලකයන් සමඟ හොඳ අවබෝධයකින් හා සාමූහිකව එකමුතු වී ජනතාවට,හොඳ ජනතා සේවාවක් ලබා දීමට කටයුතු කළ බවත් ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

තිස්සමහාරාම යනු ඓතිහාසික පුරවරයක් බවත් එහි පදනම වාරි පද්ධතිය සමඟ සම්බන්ධ වූ කෘෂි කර්මාන්තය සමඟ ගොඩනැගී පවතින බවත්,කිරිදිඹය ,ලුණුගම්වෙහෙර ව්‍යාපාරය හා වෙහෙරගල යන ජලාශ හා සම්බන්ධ වූ ප්‍රධාන වැව් 05 කින් සහ අතිරේක වැව් 42 කින් යුතු වාරිමාර්ග පද්ධතිය හා සම්බන්ධ කෘෂිකාර්මික ජන ජීවිතයකට හිමිකම් පාන ජනතාවට ,ජන ජීවිතය පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සැලසීම මහජන නියෝජිතයින් වන අපගේ කාර්යභාරය වන බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

තිස්සමහාරාම මහා විහාරය, කතරගම, සිතුල්පව්ව හා කිරින්ද යන පූජනීය ස්ථානයන්ට අමතරව දෙස් විදෙස් සංචාරකයන් ගැවසෙන ස්ථානයක් වීමත්, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සතුව මුහුදු වෙරළ තීරයක් හිමිව පැවතීමත්, පලටුපාන ලුණු ලේවාය හා යාල බුන්දල වනෝද්‍යාන පිහිටා තිබීමත් හේතුවෙන් තිස්සමහාරාමය ඉතාමත් සුවිශේෂී ස්ථානයක පිහිටා තිබෙන බැවින් එකී සියලු සම්පත් ඵලදායී ලෙස භාවිතා කරමින් හා රැක ගනිමින් තිස්ස පුරවරය ගොඩනැගීම අරමුණු කරගනිමින් පියවරෙන් පියවර ඉදිරියට යාමට සාමූහිකව හා සහෝදරත්වයෙන් කටයුතු කරමින් ජනතාව අපේක්ෂාකරන ආකාරයේ ප්‍රාදේශීය සභාවක් ගොඩ නැඟීමට ඒකරාශීවකටයුතු ලෙස ආරාධනා කරමින් ,සියලුම ප්‍රාදේශීය සභා මන්ත්‍රීයන්හඳුනාගැනීමෙන් අනතුරුව න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදී.

(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම - නැත

(ආ) ගරු සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදනය -

I. 2023 අංක 09 දරණ දූෂණ විරෝධී පනතට අනුව 2025 වර්ෂයට අදාළ වත්කම් බැරකම් ප්‍රකාශ 2025 ජුනි 30 දිනට පෙර ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

II. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 32/2019 දරණ දේශපාලන අයිතිවාසිකම් භුක්තිවිඳීම සම්බන්ධයෙන් වන ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 3.7 උප වගන්තිය ගරු සභාපතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 12/2021 දරණ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම වලදී ජයග්‍රහණය කර එම ආයතන වල නගරාධිපති /සභාපති,නියෝජ්‍ය නගරාධිපති/

උප සභාපති,නාගරික මන්ත්‍රීවරුන් / ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් ලෙස තේරිපත් වූ දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධරයන් වෙත ලබා දී ඇති රාජකාරි නිවාඩු සංශෝධනය පිළිබඳ ගරු සභාපතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

IV. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/1992 දරණ පලාත් පාලන ආයතනවලට තේරිපත් වූ මහජන නියෝජිතයන් ආමන්ත්‍රණය කිරීම පිළිබඳ ගරු සභාපතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

V. 2026 වර්ෂයට අදාළව අයවැය ලේඛන සැකසීමේ කාලසටහනට අනුව 2025 ජූලි 30 දිනට පෙර යෝජනා ලබාගත යුතුයි.එබැවින් එම යෝජනා එදිනට පෙර ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් විසින් සභාව දැනුවත් කරන ලදී.

(ඈ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන

- ජාතික විගණන කාර්යාලය මගින් නිකුත් කරන ලද, තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) උප වගන්ති ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවට අනුව තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයන් පිළිබිඹු කරන බව විගණකාධිපති විසින් පිලිගෙන ඇති බව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.
- 2025.06.24 සහ 25 යන දෙදින පෙ.ව.9.00 ට තිස්ස වයිල්ඩ් කෝස්ට් හොටෙල් හි දී පැවැත්වීමට සැලසුම් කර තිබෙන පුහුණු වැඩමුළුව සඳහා තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ,සියලුම ප්‍රාදේශීය සභා මන්ත්‍රීයන් සහ ලේකම්තුමිය සහභාගීවන ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය සභාව වෙත දැනුම් දී ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

(ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -

(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා

1. <u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තිය ප්‍රකාරව කාරක සභා පත්කර ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව</u>

<u>2025 වර්ෂය සඳහා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව පත්කිරීමේ යෝජනාව.</u>

i. 2025 වර්ෂයේ ජූනි මස සිට දෙසැම්බර් මස දක්වා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව සඳහා පහත සාමාජිකයින් පත් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

01.ගරු සභාපති - එච්.එල්.ජයසිරි මහතා (කමිටු සභාපති )
02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඩබ්.සිරිසේන මහතා (කමිටු සාමාජික)
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඩී.නිපුන ගයාශාන් මහතා (කමිටු සාමාජික)
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.එල්.එම්.අසාර් මහතා (කමිටු සාමාජික)
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.වයි.නුවන් චතුරංග මහතා (කමිටු සාමාජික)
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී.සුජීවා නිල්මිණි මහත්මිය (කමිටු සාමාජික)

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>2025 වර්ෂය සඳහා නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව පත්කිරීමේ යෝජනාව.</u>

ii. 2025 වර්ෂයේ ජුනි මස සිට දෙසැම්බර් මස දක්වා නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව සඳහා පහත සාමාජිකයින් පත් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

01. ගරු සභාපති - එච්.එල්.ජයසිරි මහතා (කමිටු සාමාජික )
02.ගරු උප සභාපති - ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා (කමිටු සභාපති )
03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ජී.ආරියසේන මහතා (කමිටු සාමාජික)
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.කේ.නිලූකා කුමුදුනි මහත්මිය (කමිටු සාමාජික)
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.රත්න මහතා (කමිටු සාමාජික)
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ජී.තමිලා දිල්රුක්ෂි මහත්මිය (කමිටු සාමාජික)
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.එල්.එම්.හනීෆා මහතා (කමිටු සාමාජික)
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - උදානි ලියනගේ මහත්මිය (කමිටු සාමාජික)

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනහේවා මහතා විසින් ස්ථිර කරන ලදි.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>2025 වර්ෂය සඳහා කාර්මික සේවා කාරක සභාව පත්කිරීමේ යෝජනාව.</u>

iii. 2025 වර්ෂයේ ජුනි මස සිට දෙසැම්බර් මස දක්වා කාර්මික සේවා කාරක සභාව සඳහා පහත සාමාජිකයින් පත් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

01.ගරු සභාපති - එච්.එල්.ජයසිරි මහතා (කමිටු සාමාජික )
02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඩබ්.සිරිසේන මහතා (කමිටු සභාපති )
03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.එම්.අනුර ප්‍රියන්ත මහතා (කමිටු සාමාජික)
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සුදත් චමින්ද උයනහේවා මහතා (කමිටු සාමාජික)
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.දයාසේන මහතා (කමිටු සාමාජික)

06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඒ.සුනිල් ප්‍රියංකර මහතා (කමිටු සාමාජික)
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - හර්ෂ උදයකුමාර ජයවීර මහතා (කමිටු සාමාජික)

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.කේ.නිලූකා කුමුදුනි මහත්මිය විසින් ස්ථිර කරන ලදි.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>2025 වර්ෂය සඳහා පරිසර හා පොදු පහසුකම් කාරක සභාව පත්කිරීමේ යෝජනාව.</u>

iv. 2025 වර්ෂයේ ජුනි මස සිට දෙසැම්බර් මස දක්වා පරිසර හා පොදු පහසුකම් කාරක සභාව සඳහා පහත සාමාජිකයින් පත් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

01.ගරු සභාපති - එච්.එල්.ජයසිරි මහතා (කමිටු සාමාජික )
02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.පී.කමිලා දිල්රුක්ෂි මහත්මිය (කමිටු සභාපති )
03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ටී.චමින්ද ජයනාත් මහතා (කමිටු සාමාජික)
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.කේ.නිලූකා කුමුදුනි මහත්මිය (කමිටු සාමාජික)
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඩබ්.සිරිසේන මහතා (කමිටු සාමාජික)
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.ඒ.තනුජා දිලානි මහත්මිය (කමිටු සාමාජික)
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එල්.වීරේන්ද්‍ර විරාජ් මහතා (කමිටු සාමාජික)

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

2. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුව පත්කර ගැනීම සඳහා වූ සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව.</u>

2025 වර්ෂයේ ජුනි මස සිට දෙසැම්බර් මස දක්වා ප්‍රසම්පාදන කමිටුව සඳහා පහත සාමාජිකයින් පත් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

01.ගරු සභාපති - එච්.එල්.ජයසිරි මහතා (කමිටු සභාපති )
02. ගරු උප සභාපති - ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා (කමිටු සාමාජික)
03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඩබ්.සිරිසේන මහතා (කමිටු සාමාජික)
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඩී.නිපුන ගයාශාන් මහතා (කමිටු සාමාජික)
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.වයි.නුවන් චතුරංග මහතා (කමිටු සාමාජික)
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී.පුෂ්පා නිල්මිණි මහත්මිය (කමිටු සාමාජික)
07.ලේකම් - ආර්.එම්.පී.වැලිවිහාරේ මහත්මිය
08. ප්‍රධාන කළමණාකරන සේවානිලධාරී - එස්.පී.එල්.එම්.සෝමරත්න මහතා
09.අභ්‍යන්තර විගණන නිලධාරී- වයි.පී.එම්.නිරාශා මහත්මිය
10.තාක්ෂණ සේවා නිලධාරී - එල්.පී.ජගත් කුමාර මහතා
11. තාක්ෂණ සේවා නිලධාරී - එම්.ඩබ්.පී.චතුරිකා මහත්මිය
12.විෂය නිලධාරී - ආර්.කේ.ඩී.ලක්ෂාණි මහත්මිය

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.දයාසේන මහතා විසින් ස්ථිර කරන ලදි. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

3. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටුව පත්කර ගැනීම සඳහා වූ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව.</u>

1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ, සංශෝධිත 1982 අංක 04 දරණ පනතේ ,08 ආ (1) වගන්ති ප්‍රකාරව සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීමට, ක්‍රියාවේ යෙදවීමට හා බලාත්මක කිරීමට අදාළව සියලු කාරණා සම්බන්ධයෙන් අධිකාරියේ විධානය ,අධීක්ෂණය හා පාලනය යටතේ , සැලසුම් කිරීමේ කමිටුවක් පිහිටුවීම සඳහා තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව වෙත බලය පවරා ඇත.එසේ පිහිටුවනු ලබන සැලසුම් කමිටුවක සංයුතිය පහත නිලධාරීන්ගෙන් සමන්විත විය යුතු බවත්, 2025.06.13 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම ප්‍රාදේශීය සභාවේ පවත්වනු ලබන සැලසුම් කමිටුව සඳහා නව කමිටු සාමාජිකයින් ලෙස පහත නම් සඳහන් අය පත්කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | තනතුර |
|---|---|
| 01 | සභාපති |
| 02 | ලේකම් |
| 03 | නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් නිලධාරි |
| 04 | තාක්ෂණ සේවා නිලධාරි |
| 05 | තාක්ෂණ සේවා නිලධාරි |
| 06 | විෂය නිලධාරි |

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

4. <u>උපදේශක කාරක සභා පත්කර ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව.</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සංවර්ධන උපදේශක සභාව, පරිසර උපදේශක සභාව, පුස්තකාල උපදේශක සභාව සහ අයවැය උපදේශන සභාව යන උපදේශක කාරක සභා පත්කර ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

- <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති , ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

  මෙම උපදේශක කාරක සභා සඳහා කමිටු සාමාජිකයන් ඉදිරියේ දී පත්කර ගැනීම කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදි.

5. <u>2025 වර්ෂයේ මාසික සභා රැස්වීම පැවැත්වීමට දින නියම කර ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව.</u>

2025 වර්ෂයට අදාළව ඉදිරි මාස සඳහා සකස් කරන ලද රැස්වීම් කාල සටහන සභාගත කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | රැස්වීම | පැවැත්වෙන වේලාව | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | මාසික සභා රුැස්වීම | පෙ.ව.10.00 | 13 | 17 | 21 | 18 | 16 | 20 | 03/18 |
| 02 | මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව | ප.ව.01.00 | 19 | 03 | 07 | 04 | 02 | 06 | 02 |
| 03 | කාර්මික සේවා කාරක සභාව | පෙ.ව.09.30 | 19 | 03 | 07 | 04 | 02 | 06 | 02 |
| 04 | නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව | ප.ව.01.00 | 18 | 02 | 06 | 03 | 01 | 04 | 01 |
| 05 | පරිසර හා පොදු පහසුකම් කාරක සභාව | පෙ.ව.09.30 | 18 | 02 | 06 | 03 | 01 | 04 | 01 |

සැ.යු :- හදිසි සහ අත්‍යාවශ්‍ය කාරණාවකදී ඉහත රැස්වීම් දිනයන් වෙනස් විය හැකි අතර, එසේ වෙනස්වන දින දැනුම් දීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

6. <u>තොරතුරු පනත යටතේ නම්කළ නිලධාරියා සහා තොරතුරු නිලධාරියා පත් කිරීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව.</u>

බාහිර පාර්ශවයන් විසින් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව වෙත ,2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිවාසිකම පිළිබඳ පනත යටතේ ඉල්ලුම් කරන ලද තොරතුරු ඉදිරිපත් කිරීමට අදාලව ,තොරතුරු නිලධාරි ලෙස තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්.එම්.චතුරානි වැලිවිහාරේ මහත්මිය හා නම්කළ නිලධාරි ලෙස තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති එච්.එල්.ජයසිරි මහතා සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

7. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ගෙවීම් කටයුතු කිරීමේ බලය මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට පැවරීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව.</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ගෙවීම් කටයුතු කිරීමේ දී ඉදිරි තත්වයන් සලකාබලා නැවත සංශෝධනය කිරිමට යටත් ව දැනට රු. ලක්ෂයක (රු.100,000.00) සීමාව යටතේ වියදම් දැරීමට මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට බලය පැවරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනහේවා මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

8. <u>අයවැය ලේඛනය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව.</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂය වෙනුවෙන් සකස්කර ක්‍රියාත්මක කරමින් පවතින අයවැය ලේඛනය 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.
එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

9. <u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9(1) වගන්ති ප්‍රකාරව ලේකම්වරයා පත්කිරීම හා තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ චෙක්පත් අත්සන් කිරීම සඳහා බලය පැවරීම සම්බන්ධව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව.</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9(1) වගන්ති ප්‍රකාරව, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සුදුසුකම්ලත් ලේකම්වරයෙකු ලෙස පත් කරන ලද ආර්.එම්.චතුරානි වැලිවිහාරේ මහත්මිය තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ලෙස පත්කිරීම සුදුසු බවට හා තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් මහජන බැංකුව, තිස්සමහාරාම ශාඛාවේ පවත්වාගෙන යනු ලබන, පහත අංක දරණ ජංගම ගිණුම්වලට අදාළ චෙක්පත් හි පළමු අණකරු ලෙස තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ලේකම්, ආර්.එම්.චතුරානි වැලිවිහාරේ මහත්මිය ද ,දෙවන අණකරු ලෙස ප්‍රධාන කළමණාකරන සේවා නිලධාරි එස්.පී.එල්.එම්.සෝමරත්න මහතා වෙත බලය පැවරීම සුදුසුබවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

- පොදු ගිණුම - ගිණුම් අංකය 061-1-001-5-0047030
- කර්මාන්ත ගිණුම - ගිණුම් අංකය 061-1-001-1-0047616
- සේවක ණය ගිණුම - ගිණුම් අංකය 061-1-001-3-0047615

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.කමිලා දිල්රුක්ෂි මහත්මිය විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

10. <u>තිස්සමහාරාම මහා විහාරයේ පැවැත්වෙන පොසොන් උත්සවය වෙනුවෙන් සෞඛ්‍ය කම්කරුවන් යෙදවීම සම්බන්ධව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව.</u>

තිස්සමහාරාම මහා විහාරයේ පැවැත්වෙන පොසොන් උත්සවය වෙනුවෙන් නගරයේ කසළ එකතු කිරීම, කසළ කළමනාකරණ කටයුතු හා නගර පවිත්‍රතා වෙනුවෙන් 2025.06.04 වන දින සිට 2025.06.13 වන දිනය දක්වා සෞඛ්‍ය කම්කරුවන් 13 දෙනෙකුගේ සේවය දිස්ත්‍රික් මිල ගණන් යටතේ පිටතින් ලබාගැනීමට හා එම කාලසීමාව තුළ සේවයේ යෙදෙන සෞඛ්‍ය කම්කරුවන්ගේ උදෑසන ආහාරවේල ලබාදීම සුදුසුබවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ මේ වන විට සෞඛ්‍ය කම්කරුවන් විශාල ප්‍රමාණයක හිඟයක් පැවතීම හේතුවෙන් සෞඛ්‍ය කම්කරුවන්ගේ සේවය පිටතින් ලබා ගැනීමට සිදු වූ බවත් ,ඒ සඳහා දිස්ත්‍රික් මිල ගණන් යටතේ ගෙවීම් කිරීම සුදුසු බවට අදහස් දක්වන ලදි.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

11. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ දෛනික වැඩ කටයුතු කරගෙන යාම සඳහා ආදේශක/ ස්ථිර සේවකයන් බඳවා ගන්නා තෙක් සෞඛ්‍ය කම්කරුවන්ගේ සේවය පිටතින් ලබා ගැනීම හා PL බණ්ඩයේ පවතින සේවක පුරප්පාඩු 16 සඳහා සේවකයන් බඳවා ගැනීම සම්බන්ධව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබු යෝජනාව.</u>

i. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ දෛනික වැඩ කටයුතු කරගෙන යාම සඳහා ආදේශක/ ස්ථිර සේවකයන් බඳවාගන්නා තෙක්, PL බණ්ඩයේ සේවකයන් 09 දෙනෙකුගේ සේවය දිස්ත්‍රික් මිල ගණන් යටතේ පිටතින් ලබාගැනීමට සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

PL බණ්ඩයේ සේවකයන්ගේ පුරප්පාඩු පවතින හෙයින් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ දෛනික කටයුතු කරගෙන යාම ඉතා අපහසු තත්වයට පත්ව ඇති බැවින් දිස්ත්‍රික් මිල ගණන් යටතේ සේවකයින් සේවයේ යොදවා ගැනීමට වඩා ආදේශක/අනියම් මට්ටමින් සේවකයින් 09 දෙනෙකු සේවයේ යොදවා ගැනීම වඩා ලාභදායි වන බවට අදහස් දක්වන ලදි.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ii. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ දෛනික වැඩ කටයුතු කරගෙන යාම සඳහා PL බණ්ඩයේ පවතින සේවක පුරප්පාඩු 16 සඳහා ආදේශක /අනියම් හෝ ස්ථිර පදනම මත සේවකයින් බඳවා ගැනීමත්,එය පළාත් පාලන කොමසාරිස්තුමා මගින් ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| 2025.05.31 දිනට පුරප්පාඩු පවතින තනතුරු විස්තරය - PL වැටුප් මණ්ඩය | | |
|---|---|---|
| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු |
| 01 | රියදුරු | 01 |
| 02 | යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| 03 | ආයුර්වේද ඖෂධ සංයෝජක | 02 |
| 04 | මුරකරු | 01 |
| 05 | පුස්තකාල සහයක | 01 |
| 06 | ආදාහනාගාර සහයක | 01 |
| 07 | ක්‍රීඩාපිටි භාරකරු | 01 |
| 08 | කොම්පෝස්ට් කම්කරු | 04 |
| 09 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 04 |
| | එකතුව | 16 |

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.

- <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

තිස්සමහාරාම නගරය ක්‍රමවත්ව පවත්වාගෙන යාම වඩා වැදගත් වන බවත් ඒ සඳහා විශාල අඩුපාඩුවක්ව පවතින්නේ සේවක පුරප්පාඩුව බැවින් PL මණ්ඩයේ පවතින පුරප්පාඩු 16 සඳහා ආදේශක /අනියම් හෝ ස්ථිර පදනම සේවකයින් බඳවා ගැනීම සිදුකිරිමක් සුදුසු බවට අදහස් දක්වන ලදි.මෙම යෝජනාව පළාත් පාලන කොමසාරිස්තුමා මගින් ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කර තීරණයක් ගැනීම සුදුසු බවට ද ප්‍රකාශ කරන ලදි.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

12. <u>තිස්සමහාරාම මහා විහාරය,සිතුල්පව්ව පුරාණ රජ මහා විහාරයේ රාජ්‍ය පොසොන් උත්සවය සඳහා සේවා සැපයීම සම්බන්ධව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව.</u>

තිස්සමහාරාම මහා විහාරය,සිතුල්පව්ව පුරාණ රජ මහා විහාරයේ පැවති රාජ්‍ය පොසොන් උත්සවයේ , රාජකාරි කටයුතු සඳහා ජලබවුසරය, ගලිබවුසරය හා කසල වාහන යෙදවීම හා ඒ සඳහා සේවකයන් යෙදවීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.

❖ අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා

පසුගිය කාලපරිච්ඡේදය තුළ තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු ගලි බවුසරය අක්‍රිය තත්වයේ තිබු බැවින් , පළාත් සභා සහ පළාත් පාලන ගරු නියෝජ්‍ය ඇමතිතුමා වන රුවන් සෙනරත් මහතා සහ ගරු ආණ්ඩුකාරතුමාගේ මැදිහත් වීම මත කතරගම ප්‍රාදේශීය සභාව, සූරියවැව ප්‍රාදේශීය සභාව සහ හම්බන්තොට ප්‍රාදේශීය සභාව වෙතින් ගලිබවුසරය ලබාගැනිම සිදුකළ බැවින් එම ආයතන වෙත ස්තූතිය පුද කරමින් ලිපියොමු කිරිමට කටයුතු කරන ලෙස ද අදහස් දක්වන ලදි.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

13. පරිසර ආරක්ෂක බලපත්‍ර තාක්ෂණික ප්‍රගති සමාලෝචන කමිටුව සඳහා පහත සාමාජිකයන් පත් කිරිම ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව.

2025 වර්ෂයේ පරිසර ආරක්ෂක බලපත්‍ර තාක්ෂණික ප්‍රගති සමාලෝචන කමිටුව සඳහා පහත සාමාජිකයන් පත් කිරිම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | තනතුර |
|---|---|
| 01 | සභාපති |
| 02 | ලේකම් |
| 03 | පරිපාලන මහජන සෞඛ්‍ය පරික්ෂක |
| 04 | මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය පරිසර නිලධාරි |
| 05 | නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් නිලධාරි |
| 06 | තාක්ෂණ සේවා නිලධාරි |
| 07 | විෂය නිලධාරි |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදි.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ වෙනත් යෝජනා

14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මණ්ඩලය සඳහා මන්ත්‍රී දීමනාව,ඉන්ධන දීමනාව සහ දුරකථන දීමනාව ගෙවීමට සම්බන්ධව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව

ගරු සභාපතිතුමා ඇතුළු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මණ්ඩලය සඳහා මන්ත්‍රී දීමනාව,ඉන්ධන දීමනාව සහ දුරකථන දීමනාව ගෙවීමට සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනගේවා මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

15. <u>තිස්සමහාරාම නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ වහලයේ වැඩ නිමකර ගැනීම සඳහා සේවකයින් පිටතින් යොදවා ගැනීම සම්බන්ධව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව</u>

තිස්සමහාරාම නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවට දෛනිකව ප්‍රතිකාර ලබාගැනීම සඳහා විශාල රෝගීන් ප්‍රමාණයක් පැමිණෙන බැවින් එම රෝගීන් අපහසුතාවයට පත්වීම වැලැක්වීම සඳහා මෙ වන විට ආයුර්වේද ගොඩනැගිල්ලේ වැඩ නිමකර ඇති බවත්, එහි වහලයේ වැඩ නිමකර ගැනීම සඳහා තාක්ෂණික නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති රු.713,134.62 ක ඇස්තමේන්තු මුදලට අදාළව , පෙදරේරුවන් දෙදෙනෙකු ,වඩුකාර්මිකයන් දෙදෙනෙකු හා අත් උදවුකරුවන් හතර දෙනෙකුගේ සේවය පිටතින් ලබාගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.තමිලා දිල්රුක්ෂි මහත්මිය විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

16. <u>PL බණ්ඩයේ සේවකයින් අදාළ තනතුරු වල අනුයුක්ත කිරීම සම්බන්ධව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව</u>

ගරු ආණ්ඩුකාරතුමාගේ අංක GS/SP/ADM/03/09/02(II) හා 2024.05.26 දිනැති ලිපිය ප්‍රකාරව PL බණ්ඩයේ තනතුරු දරණ සේවකයින් වහාම ක්‍රියාත්මක වන පරිදි 2025.06.10 දින වන විට අදාළ තනතුරු වල රාජකාරි සඳහා යෙදවන ලෙසට නියෝග ලබා දී ඇති බැවින් අදාළ ලිපිය පරිදි එම තනතුරු වල අනුයුක්ත කිරීම මගින් ප්‍රාදේශීය සභා කාර්යාලයේ රාජකාරි කටයුතු ඉටු කිරීමේ දී දැඩි අපහසුතාවයට පත්විය හැකි අතර එනිසා පවතින සේවක පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ඉල්ලීම් ලිපියක් ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.

- <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

PL බණ්ඩයේ තනතුරු දරණ සේවකයින් අදාළ තනතුරේ රාජකාරි සඳහා යෙවීම සිදු වුවහොත් ප්‍රාදේශීය සභා කාර්යාලයේ රාජකාරි කටයුතු කරගෙන යාම අපහසු වන බැවින් අදාළ තනතුරු වල පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සිදුකරන තෙක් අදාළ තනතුරු වල රාජකාරි සඳහා යෙදවන ලෙසට ලබා දී ඇති නියෝගය ක්‍රියාත්මක නොකරන ලෙසටත් ,අදාළ තනතුරු වල පුරප්පාඩු සඳහා බඳවා ගැනීමෙන් අනතුරුව ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගය ක්‍රියාත්මක කිරීම සුදුසු බවට අදහස් දක්වන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

17. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් නඩත්තු කරනු ලබන තිස්සමහාරාම ඇවිදින මන්තීරුවේ තණකොළ කපා සුද්ධ පවිත්‍ර කර ,විපී පහන් නඩත්තු කටයුතු සිදු කිරීම සම්බන්ධව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, හර්ෂ උදයකුමාර ජයවීර මහතා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව.</u>

තිස්මහාරාම ප්‍රාදේශීය සභාව මගින් නඩත්තු කරනු ලබන තිස්සමහාරාම ඇවිදින මන්තිරුවේ තණකොළ වැව් තිබීමත්, එහි ආලෝකය නොමැති වීමත්,මත්පැන් පාවාරම්කරුවන් එම ස්ථානයේ නිතර ගැවසීමත් නිසා ,ඇවිදින මන්තිරුව භාවිතා කරන්නන් ඇඩි අපහසුතාවට පත්ව ඇති බැවින් , තිස්සමහාරාම ඇවිදින මන්තිරුවේ තණකොළ කපා සුද්ධ පවිත්‍ර කර ,විපී පහන් නඩත්තු කටයුතු සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

18. <u>අබලන්ව ඇති මාර්ග දකුණු පළාත්, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් පිළිසකර කරදෙන ලෙස දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීම් කර යැවීම සම්බන්ධව ගරු උප සභාපති, ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව</u>

තිස්සමහාරාම පුල්පල්ලම ග්‍රාම නිලධාරි වසමට අයත් වෙලි සිනමා පිවිසුම් මාර්ගය වන කතරගම ප්‍රධාන මාර්ගයේ සිට රන්මිණිතැන්න පාලම දක්වා කාපට් අතුරා ඇති කොටස තැනින් තැන පළුදු වී වලවල් සෑදීම හේතුවෙන් ද, රථවාහන අනතුරු නිරන්තරයෙන් සිදුවන බැවින් ද දකුණු පළාත්, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් පිළිසකර කරදෙන ලෙස දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීම් කර යැවීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.
එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

- <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්.සිරිසේන මහතා</u>

තිස්සමහාරාම ගුද්ධනගර ග්‍රාම නිලධාරි වසමට අයත් සේනානායක මාවතේ කොටසක් අබලන්ව තිබීම,වැඩි ජනතාවක් භාවිතා කරනු ලබන යෝධකණ්ඩියේ සිට ගමන් කළ හැකි මාර්ගය කෙටි කරන රණකෙළිය හරහා ඇති මාර්ගය තැන් කිහිපයක්ම අබලන්ව ඇති බවත්,එම මාර්ගවල අබලන් වූ ස්ථාන යථාතත්වයට පත් කරදීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසත් ඉල්ලීම් කරන ලදි.

• <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා</u>

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්.සිරිසේන මහතා විසින් සඳහන් කරන ලද යෝධකණ්ඩියේ සිට ගමන් කළ හැකි, මාර්ගය කෙටි කරන රණකෙළිය හරහා ඇති මාර්ග පළුදු වීමට ලක්වනුයේ සෆාරි ජීප් ගමන් කිරීම බැවින් එම මාර්ගය ගැටි යොදා සකස් කිරීම හෝ සෆාරි ජීප් හා බර වාහන ගමන් කිරීම නවත්වාලීම සඳහා ඒ බව දන්වමින් නාම පුවරුවක් හෝ යෙදීමට කටයුතු කරන ලෙස ඉල්ලීම් කරන ලදි.

• <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනහේවා මහතා</u>

තිස්සමහාරාම ග්‍රාම නිලධාරි වසමට අයත් අලුත්ගොඩ මාවත යථාතත්වයට පත් කර දෙන මෙන් ඉල්ලීම් කරන ලදි.

• <u>අදහස් දැක්වීම - ගරු සභාපති එච්.එල්.ජයසිරි මහතා</u>

අලුත්ගොඩ මාවත සඳහා මේ වන විට ඇස්තමේන්තු සකස් කර ඇති බවත්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම සිදු කර ඇති බවත්,ඉතාම කෙටි කාලයක් තුළ එම මාර්ගයේ වැඩ ආරම්භ කරනු ඇති බව ප්‍රකාශ කරන ලදි.

• <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතා</u>

රබර්වත්ත ගහේයාය මාර්ගයේ දී පළුදු වී ඇති ස්ථාන යථාතත්වයට පත් කරදීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසත් ඉල්ලීම් කරන ලදි.

• <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආරියසේන මහතා</u>

සඳුන්ගම මාර්ගයේ දී පළුදු වී ඇති ස්ථාන යථාතත්වයට පත් කරදීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසත් ඉල්ලීම් කරන ලදි.

• <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එල්.වීරේන්ද්‍ර විරාජ් මහතා</u>

ඇල්ලගල මාර්ගයේ දී පළුදු වී ඇති ස්ථාන යථාතත්වයට පත් කරදීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසත් ඉල්ලීම් කරන ලදි.

<u>අදහස් දැක්වීම - ගරු සභාපති එච්.එල්.ජයසිරි මහතා</u>

හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීම සඳහා ගරු මන්ත්‍රීතුමන්ලා විසින් නඩත්තු කළ යුතු මාර්ග වල විස්තර ඇතුළත් යෝජනාවන් ලබාදීමට කටයුතු කරන ලෙස දැනුවත් කරන ලදි.

(ඊ) කාරක සභාවල වාර්තා සළකා බැලීම -

(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ,එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා,වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.

2025 මැයි මාසය සඳහා මාසික ඒකාබද්ධ ලැබීම් රු.9,104,802.72 ද, මැයි මාසය සඳහා මාසික ඒකාබද්ධ වියදම රු.11,117,589.45 ද, මැයි මස මාසික ගෙවීම් වාර්තාව අනුව මුළු

ගෙවීම රු.11,117,589.45 වන බවත් හිඟ ආදායම් වාර්තාව අනුව මුළු හිඟ ආදායම රු. 10,275,977.79 වන බවට ගරු සභාපති ,එච්.එල්.ජයසිරි මහතා විසින් සභාගත කරන ලදී.

(ඌ)වෙනත් කරුණු

- <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.එම්.අසාර් මහතා</u>

සෑම සිකුරාදා දිනයක දී ම ආගමික වතාවත් සඳහා සහභාගී විය යුතු බැවින් ප්‍රාදේශිය සභාවේ මාසික මහ රැස්වීම සහ කාරක සභාවන් පවත්වනු ලබන දිනයන් සිකුරාදා දිනයන් හිදී නොපැවත්වීමට කටයුතු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

අද දින මංගල මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීයින්ට, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්මියටත්,මාධ්‍යවේදී ඒ.ඒ.ප්‍රේමසිරි මහතාටත් , රුක්මන් රත්නායක මහතාටත් සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ස්තුතිය පුද කිරීමෙන් අනතුරුව ප.ව.12.00 ට පමණ මහා සභාවේ කටයුතු අවසන් කරන ලදී.

එච්. එල්. ජයසිරි
සභාපති
ප්‍රාදේශීය සභාව
තිස්සමහාරාම.

සභාපති,
එච්.එල්.ජයසිරි,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2025 ජූනි මස 13 වන දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී